# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කාර්මික ආරාවුල් (සංශෝධන)

**(131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජූලි මස 04 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[132 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 46 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ එකී පනත යටතේ වන යම් නීති කෘත්‍යයක දී නීතිඥවරයකු හෝ එම වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නියෝජිතයකු මඟින් පාර්ශ්වකරුවන් නියෝජනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම යි.

එල්.ඩී.—ඕ. 19/2017

**(131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2022 අංක  දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 46 වන වගන්තියේ (1), (2) සහ (3) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

131 වන අධිකාරයේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1) යම් බලයලත් නිලධරයකු, බේරුම්කරුවකු, කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ කොමසාරිස්වරයා විසින් හෝ ඉදිරිපිට දී ගනු ලබන, මේ පනත යටතේ වූ යම් නීති කෘත්‍යයක පාර්ශ්වයක් විසින් නීතිඥවරයකු මඟින් හෝ නියෝජිතයකු මඟින් ක්‍රියාකරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ කාර්ය සඳහා, යම් පාර්ශ්වකරුවකුගේ නියෝජිතයකු—

(අ) එම පාර්ශ්වය වෘත්තීය සමිතියක් වන අවස්ථාවක හෝ වෘත්තීය සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වන අවස්ථාවක, එම වෘත්තීය සමිතිය හෝ එක් එක් වෘත්තීය සමිතිය නියෝජනය කිරීම සඳහා වූ තැනැත්තකු විය යුතු ය;

(ආ) එම පාර්ශ්වය අර්ධ වශයෙන් යම් වෘත්තීය සමිතියකින් හෝ සමිතිවලින් ද, අර්ධයක් ඒ සමිතියක සාමාජිකයන් නොවන සේවායෝජකයන්ගෙන් හෝ සේවකයන්ගෙන් ද, සමන්විත වන අවස්ථාවක දී, ඒ සමිතිය නියෝජනය

කිරීම සඳහා වූ තැනැත්තකු නැතහොත් ඒ එක් එක් සමිතිය නියෝජනය කිරීම සඳහා වූ තැනැත්තකු සහ එකී සේවායෝජකයන් හෝ සේවකයන් විසින් නම් කරනු ලබන, නියෝග මඟින් නියම කරනු ලබන තැනැත්තන් නියමිත සංඛ්‍යාවක් වන්නේ ය; සහ

(ඇ) එම පාර්ශ්වය සේවායෝජකයන් හෝ සේවකයන්ගෙන් සමන්විත වන අවස්ථාවක, එම පාර්ශ්වය එම සේවායෝජකයන් හෝ සේවකයන් විසින් නම් කරනු ලබන තැනැත්තන් නියමිත සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.